# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1601/24 - 2009 මැයි 14 වැනි බ්‍රහස්පතින්දා - 2009.05.14**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (අ) වැනි කොටස — පළාත් සභා

## පළාත් සභා නිවේදන

**වයඹ පළාතේ පළාත් සභාවේ 2008 අංක 01 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය**

වයඹ පළාතේ පළාත් සභාවේ 2008 අංක 01 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 24 වැනි වගන්තිය යටතේ එකී පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, ප්‍රවාහන, පරිසර, සංචාරක, ආයෝජන සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදාහැරීම් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

අතුල සරත් කුමාර විජේසිංහ,
වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, ප්‍රවාහන, පරිසර, සංචාරක,
ආයෝජන සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන සහ
ආහාර සැපයුම් හා බෙදාහැරීම් අමාත්‍ය.

2009 අප්‍රේල් මස 29 වැනි දින,
කුරුණෑගල දී ය.

නියෝග

1. මෙම නියෝග වයඹ පළාතේ පළාත් සභාවේ 2008 අංක 01 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. I. 1992 අංක 11 දරන හා 1983 අංක 32 දරන, සංශෝධිත පනත්වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර පනත යටතේ වයඹ පළාතේ ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක හෝ සේවයේ නියුතු, මෙහි මින් මතු සේවකයා යනුවෙන් හඳුන්වනු ලබන 1995 අංක 05 දරන වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ අර්ථානුකූලව ස්ථිර පත්වීමක් ලද සේවකයෙකු, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකයකු වශයෙන් බඳවා ගනු ලැබීමට හිමිකම් ලැබිය යුතු ය. — දායකයකු වීමට සුදුසුකම්.

1A - PG 001028 — 525 (2009/05)

II. ඉහත අංක 2.I. යටතේ කෙසේ සඳහන් වුවත්, වයඹ පළාතේ පළාත් සභාවේ 2008 අංක 01 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට, සමුපකාර සමිතියක හෝ සංගමයක හෝ සේවයේ නියුතුව සිටි, ඉහත 2.I. කොන්දේසියේ පරිදි ස්ථිර පත්වීමක් නොලද සේවකයින් ඔවුන්ට පෞද්ගලිකවන සේ, අනුමත පිරිස්බල තක්සේරුවට අනුව සුදුසු තනතුරුවල ස්ථිර කිරීම සඳහා වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමැතිය ලබා තිබේ නම්, ඔවුන්ට පෞද්ගලික වන සේ මෙම යෝජනා ක්‍රමය යටතේ හිමිකම් ලැබීමට සුදුස්සන් වන්නේ ය.

III. මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක දිනට පසුව බඳවාගත් සේවකයින් සම්බන්ධයෙන් ඉහත 2.II. අදාළ නොවේ.

*මනාපය පළ කිරීම හා අයැදුම් කිරීම.*

3\. I. (අ) මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මකවන දිනට සේවයේ නියුතුව සිටි, යෝජනා ක්‍රමයට බඳවා ගනු ලැබීමට හිමිකම් ලැබූ තැනැත්තෙකු, තමා දායකයකු ලෙස විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීම සඳහා මනාපය පළකළ යුතු ය.

(ආ) මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීමට අපේක්ෂා කරන සේවකයෙකු විසින්, මෙහි මින්මතු අධ්‍යක්ෂවරයා යයි හඳුන්වනු ලබන යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂකවරයා විසින්, භාවිතා කිරීමට නියම කර ඇති ඉල්ලුම්පත්‍ර පුරවා තත්කාලයේ බලය පවරා ඇති නිලධාරියා වෙත අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ලද කාලසීමාවක් තුළ ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) ඉහත 3.I. (ආ) හි සඳහන් කාලසීමාව මෙම නියෝග ක්‍රියාත්මකවන දින සිට එක් අවුරුදු කාලයක් නොඉක්මවන කාලයක් විය යුතු ය.

II. මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වූ දිනෙන් පසුව හා මෙම නියෝග ක්‍රියාත්මක වීමට පෙර ස්ථිර සේවයට බැඳෙන හා බැඳුනු සේවකයින්, අධ්‍යක්ෂවරයා විසින් භාවිතය සඳහා නියම කර ඇති ඉල්ලුම් පත්‍රය පුරවා අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා වෙත මෙම නියෝග ක්‍රියාත්මකවන දින සිට දින 90 ක් හෝ තමන් සේවයට බැඳුනු දින සිට දින 90 ක් හෝ යන දෙකෙන් පසුව එළඹෙන දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

III. මෙම නියෝග ක්‍රියාත්මක වූ දින සිට ස්ථිර සේවයට බැඳුනු සේවකයෙකු, තමා සේවයට බැඳුනු දින සිට දින 90 ක කාලයක් ඇතුළත දී අධ්‍යක්ෂවරයා විසින් භාවිතය සඳහා නියම කර ඇති ඉල්ලුම්පත්‍රය පුරවා තත්කාර්ය සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

*දායකයකු ලෙස සැලකීම.*

4\. I. බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට ඉල්ලුම්කරුගේ සුදුසුකම් පිළිබඳව සපයන ලද තොරතුරුවල සත්‍යතාවය හා නිවැරදිභාවය බලය පවරනු ලැබූ නිලධාරියා විසින් තහවුරු කරගතයුතු අතර, ඉල්ලුම් පත්‍රය ලැබී දින 30 ක් ඇතුළත තම නිර්දේශය සමග අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

II. අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලුම් පත්‍රය අනුමත කළවිට එම ඉල්ලුම්කරු යෝජනා ක්‍රමයේ දායකයකු ලෙස සැලකේ.

*අයැදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම.*

III. පහත දැක්වෙන එක් කරුණක් හෝ කරුණු කීපයක් මත යම් ඉල්ලුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය :-

(අ) මෙම නියෝග මාලාවේ 2.I, 2.II සඳහන් ආකාරයට සේවකයකු නොවූ විටක ;
(ආ) වයස අවු. 18 ට අඩු සහ වයස අවු. 60 ඉක්ම වූ සේවකයකු වූ විට ;
(ඇ) ඉල්ලුම් පත්‍රය අසම්පූර්ණ වූ විටක ;
(ඈ) අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති විටක ;
(ඉ) ඉල්ලුම්පත්‍ර මෙම නියෝග මාලාවේ නියම කර ඇති කාලසීමාව තුළ ඉදිරිපත් කර නොතිබූ විටක.

IV. යම් ඉල්ලුම්පත්‍රයක් අධ්‍යක්ෂවරයා විසින් ප්‍රතික්ෂේප කිරීම, මෙහි මින්මතු උපදේශක කාරක සභාව යනුවෙන් සඳහන් කරනු ලබන යෝජනා ක්‍රමයේ උපදේශක කාරක සභාවේ එකඟතාවය මත ක්‍රියාත්මක කළ යුතුය. එසේ ඉල්ලුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමට තීරණය ලැබූ අවස්ථාවක, උපදේශක කාරක සභාවේ එකඟතාවය ලැබූ දින සිට දින 30 ක් ඇතුළත ඉල්ලුම්කරු වෙත අධ්‍යක්ෂවරයා විසින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

5. I. යෝජනා ක්‍රමයට බැඳෙන දායකයකු තම මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට පහක් මාසික දායකය වශයෙන් අධ්‍යක්ෂවරයා වෙත ගෙවිය යුතු වන අතර, එම දායක මුදල තම මාසික වැටුපෙන් අයකර අධ්‍යක්ෂවරයා වෙත යැවීම සඳහා සේවායෝජක සමිතියට හෝ සංගමයට ලිඛිත ව බලය පැවරිය යුතු ය. දායක මුදල.

II. සේවායෝජක සමිතිය හෝ සංගමය හෝ විසින් යෝජනා ක්‍රමයට බැඳෙන එක් එක් දායකයකු වෙනුවෙන් රුපියල් පන්දහසක් (රු. 5000) දායකයා යෝජනා ක්‍රමයට බැඳුනු දින සිට අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන කාලසීමාවක් ඇතුළත එකවර හෝ වාරික කීපයකින් හෝ අධ්‍යක්ෂවරයා වෙත ගෙවිය යුතුය. කෙසේ වුවත් අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන කාලසීමාව මාස 6 ක් නොඉක්ම විය යුතු ය. සමිති දායකය.

III. සේවායෝජක සමිතිය හෝ සංගමය හෝ විසින්, එක් එක් සේවකයාගේ මාසික වැටුපෙන් අඩුකර අයකරගන්නා ලද මාසික දායක මුදල් ඊළඟ මස අවසන් දින හෝ ඊට පෙර අධ්‍යක්ෂවරයාට ලැබෙන සේ යවනු ලැබිය යුතු ය. දායක මුදල් ප්‍රේෂණය.

IV. ඉහත 5.III හි නියම කර ඇති පරිදි නියමිත දිනට දායක මුදල් අධ්‍යක්ෂවරයා වෙත යැවීම පැහැර හැර ඇති විටෙක, අදාළ සමුපකාර සමිතිය හෝ සංගමය හෝ පහත සඳහන් පරිදි දඩ මුදලකට යටත්විය යුතුය. එම දඩ මුදල අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන දිනකට ගෙවා නිමකළ යුතු ය :- දඩ මුදල් අය කිරීම.

| | | |
|---|---|---|
| ප්‍රමාදය දින 10 නොඉක්ම වූ විට | - | 05 % |
| ප්‍රමාදය දින 11 ත් මාස 01 අතර වන විට | - | 15 % |
| ප්‍රමාදය මාස 01 ත් මාස 03 අතර වන විට | - | 20 % |
| ප්‍රමාදය මාස 03 ත් මාස 06 අතර වන විට | - | 30 % |
| ප්‍රමාදය මාස 06 ත් මාස 12 අතර වන විට | - | 40 % |
| ප්‍රමාදය මාස 12 ඉක්මවන විට | - | 50 % |

6. මෙම යෝජනා ක්‍රමයේ දායකයෙකු, විශ්‍රාම වැටුප් හිමිකම් ලැබීම සඳහා අවම වශයෙන් මාස 60 ක දායක මුදල් අනිවාර්යයෙන්ම අධ්‍යක්ෂකරවයා වෙත ගෙවා සම්පූර්ණ කර තිබිය යුතුය :- අවම දායක මුදල හා විශ්‍රාම වැටුප හිමිකම.

I. (අ) විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය ක්‍රියාත්මකවන දිනට වයස අවුරුදු 55 ඉක්ම වූ දායකයකු සම්බන්ධයෙන් වූ විට දී, වාරික 60 කින් සිය අවම දායක මුදල් ගෙවීමට නොහැකි වන අවස්ථාවක දී, ඉතිරි හිඟ වාරික ප්‍රමාණය එකවර හෝ කොටස් වශයෙන් දායකයා විසින් අවසන් වරට ලැබූ වැටුප පදනම් කරගෙන, වයස අවුරුදු 60 වන විට අධ්‍යක්ෂවරයා වෙත අදාළ දායක මුදල් ගෙවා නිම කළ යුතු ය.

(ආ) එසේ වුවද යම් හෙයකින් වයස අවුරුදු 60 වන විට අවම දායක මුදලවන මාසික වාරික 60 ක මුදල, ගෙවා නිම කිරීමට යම් දායකයෙකුට නොහැකියාවක් ඇත්නම්, විශ්‍රාම යාමෙන් එක් අවුරුදු උපරිම කාලසීමාවක් ඇතුළත එකී දායක මුදල් ගෙවා නිම කිරීමට එකී දායකයාට හිමිකම් ඇත.

(ඇ) ඉහත 6.1.(අ) හා 6.1.(ආ) යටතේ දායක මුදල් ගෙවා නිමකරන දායකයකුට, විශ්‍රාම වැටුප සඳහා හිමිකම් ලැබෙන්නේ මෙම නියෝගවල (අ) උපලේඛනයේ වගු අංක 02 හි සඳහන් වන ආකාරයට ය.

II. (අ) විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනට සේවය කරමින් සිට, මෙම නියෝග ක්‍රියාත්මක වන දිනට සේවයෙන් විශ්‍රාම ලබා ඇති, මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්වය ලැබූ දායකයෙකු, සිය අවම දායක මුදල් වාරික 60 එකවර හෝ කොටස් වශයෙන්, ඔහු විසින් අවසන් වරට ලැබූ වැටුප පදනම් කරගෙන එක් අවුරුදු කාලසීමාවක් තුළ ගෙවා නිම කළ යුතු ය.

(ආ) ඉහත 6.II.(අ) යටතේ දායක මුදල් ගෙවා නිම කරන දායකයෙකුට, විශ්‍රාම වැටුප සඳහා හිමිකම් ලැබෙන්නේ මෙම නියෝගවල (අ) උපලේඛනයේ වගු අංක 02 හි සඳහන්වන ආකාරයට ය.

(ඇ) මෙම යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේ දී ඊළඟ උපන්දිනට වයස අවුරුදු 55 ට නොවැඩි දායකයකු සම්බන්ධයෙන් වූ විට දී, මෙම නියෝගවල (අ) උපලේඛනයේ වගු අංක 01 හි සඳහන් ආකාරයට අවම මාසික දායක මුදල් ගෙවිය යුතු අතර, එම වගුවේ IV වැනි තීරයේ සඳහන් ආකාරයට විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇත්තේ ය.

7. වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ලබා ඇති දායකයකු සම්බන්ධයෙන් වූ විට —

වෛද්‍ය හේතුන් මත ප්‍රතිලාභ.

I. ඔහු විශ්‍රාම ලැබූ දිනට වයස අවුරුදු 50 ඉක්මවූ දායකයකු, අවම වශයෙන් දායක මුදල් වාරික 60 ක් ගෙවා ඇති විට, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇත.

II. දායකයා විශ්‍රාම ලැබූ දිනට වයස අවුරුදු 50 නොඉක්මවූ දායකයකු, අවම වශයෙන් දායක මුදල් වාරික 120 ක් ගෙවා ඇති විටක, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තේ ය.

III. එසේ වුව ද දායකයා ඉල්ලා සිටින්නේ නම්, එතෙක් අය වූ දායක මුදල් හා ඊට අදාළ පොලිය, උපදේශක කාරක සභාවේ උපදෙස් මත එකවර ගෙවනු ලබන ගොනු මුදලක් ලෙස ලැබීමට දායකයෙකුට හිමිකම් ඇත්තේ ය.

IV. දායකයෙකුට හිමිකම් ඇත්තේ ඉහත 7.I හෝ 7.II යටතේ විශ්‍රාම වැටුපක් හෝ 7.III යටතේ ගොනු මුදලක් හෝ යන දෙකෙන් එක් ප්‍රතිලාභයක් පමණක් ලබා ගැනීමට ය.

V. වයස අවුරුදු 50 ඉක්ම වූ සේවකයෙක් සම්බන්ධයෙන් වූ විටක, අවම දායක මුදල් වාරික 60 ක් වත් නොගෙවා ඇති විටක, අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ලද කාලයක් තුළ දී හිඟ දායක වාරික මුදල් එකවර හෝ වාර කීපයකින් හෝ ගෙවා නිම කරන ලද දායකයෙකුට, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විටක විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තේය. හිඟ වාර මුදල් ගෙවීම සඳහා නියම කරන ලද කාලය, දායකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනයේ හෝ ගෙවීම් නියම කරනු ලබන දිනයේ සිට එක් අවුරුදු කාලසීමාවක් යන දෙකෙන් පළමුව එළඹෙන දිනය විය යුතු ය.

VI. වයස අවුරුදු 50 ට වඩා අඩුවන සේවකයෙකු සම්බන්ධයෙන් වූ විටක, අවම දායක වාරික මුදල් වාරික 120 ක් නොගෙවා ඇති විටක, දායකයාගෙන් එතෙක් අය වූ දායක මුදල් හා ඊට අයත් පොලිය උපදේශක කාරක සභාවේ එකඟත්වය මත එකවර ගෙවනු ලබන ගොනු මුදලක් ලෙස ලැබීමට එවැනි දායකයකුට හිමිකම් ඇත්තේ ය.

VII. ඉහත 7.V. යටතේ හිමිකම් නොපාන්නේ නම්, එවැනි දායකයකු සඳහා උපදේශක කාරක සභාවේ එකඟත්වය ඇතිව, ශුද්ධ දායක මුදල හා අදාළ පොලී මුදල් එකවර ගෙවනු ලබන ගොනු මුදලක් ලෙස ලබා ගැනීමට හිමිකම් ඇත.

සේවයෙන් ඉල්ලා අස් වූ විට ගෙවනු ලබන ප්‍රතිලාභ.

8. දායකයකු විශ්‍රාම වැටුප හිමි වීමට පෙරාතුව සමූපකාර සේවයෙන් ඉල්ලා අස්වන්නේ නම්, ඔහු යෝජනා ක්‍රමයෙන් ඉවත් වූ ලෙස සැළකිය යුතු අතර, එවැනි අයෙකු අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව කරන ඉල්ලීමක් මත, අධ්‍යක්ෂවරයා විසින් උපදේශක කාරක සභාවේ එකඟත්වය මත තීරණය කරනු ලබන දායකයාගේ ශුද්ධ දායක මුදල සහ ඊට අදාළ වන පොලිය, එකවර ගෙවන ගොනු මුදලක් ලෙස ලැබීමට එකී දායකයාට හිමිකම් ලැබිය හැකි ය.

වැටුප් රහිත නිවාඩු ලබා ඇති විට.

යම් දායකයකු විධිමත්ව විදේශ රැකියාවක් සඳහා වැටුප් රහිත නිවාඩු ලබා තාවකාලිකව සමූපකාර සේවයෙන් ඉවත්ව සිටි අවස්ථාවක දී, එම වැටුප් රහිත සේවා කාලය විශ්‍රාම වැටුප ගණනය කිරීම සඳහා ගණන් නොගත යුතු අතර එම කාලය සඳහා දායක මුදල් ද අය නොකළ යුතු ය.

අවලංගු කළ සමිතියක හෝ සංගමයක හෝ දායකයකුට ප්‍රතිලාභ.

9. යම් සමූපකාර සමිතියක් හෝ සංගමයක් හෝ නීතිය අනුව ඈවර කිරීම සඳහා ලියාපදිංචිය අවලංගු කර ඇති විටෙක, සමිතිය හෝ සංගමයේ හෝ ලියාපදිංචිය අවලංගු කරන දිනය දක්වා දායක මුදල් ගෙවා ඇති විටෙක—

I. සමිතියේ හෝ සංගමයේ ලියාපදිංචිය අවලංගු කරන ලද දිනට වයස අවුරුදු 50 ඉක්ම වූ දායකයෙකු අවම වශයෙන් දායක මුදල් වාරික 60 ක් ගෙවා ඇති විටක, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත.

II. සමිතියේ හෝ සංගමයේ ලියාපදිංචිය අවලංගු කරන ලද දිනට වයස අවුරුදු 50 නොඉක්මවූ දායකයකු, අවම වශයෙන් දායක මුදල් වාරික 120 ක් ගෙවා ඇති විටක, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තේ ය.

III. එසේ වුව ද දායකයා ඉල්ලා සිටින්නේ නම්, එතෙක් අය වූ දායක මුදල් හා ඊට අදාළ පොළිය උපදේශක කාරක සභාවේ උපදෙස් මත එකවර ගෙවනු ලබන ගොනු මුදලක් ලෙස ලැබීමට දායකයෙකුට හිමිකම් ඇත්තේ ය.

IV. දායකයෙකුට හිමිකම් ඇත්තේ, ඉහත 9.I හෝ 9.II යටතේ විශ්‍රාම වැටුපක් හෝ 9.III යටතේ ගොනු මුදලක් හෝ යන දෙකෙන් එක් ප්‍රතිලාභයක් පමණක් ලබා ගැනීමට ය.

V. වයස අවුරුදු 50 ඉක්ම වූ සේවකයෙක් සම්බන්ධයෙන් වූ විටක, අවම දායක මුදල් වාරික 60 ක් වත් නොගෙවා ඇති විටක, අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ලද කාලයක් තුළ දී හිග දායක වාරික මුදල් එකවර හෝ වාර කීපයකින් හෝ ගෙවා නිම කරන ලද දායකයෙකුට, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විටක විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තේය. හිග වාර මුදල් ගෙවීම සඳහා නියම කරන ලද කාලය, දායකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනයේ හෝ ගෙවීම් නියම කරනු ලබන දිනයේ සිට එක් අවුරුදු කාල සීමාවක් යන දෙකෙන් පළමුව එළඹෙන දිනය විය යුතු ය.

VI. වයස අවුරුදු 50 ට වඩා අඩුවන සේවකයෙකු සම්බන්ධයෙන් වූ විටක, අවම දායක වාරික මුදල් 120 ක් නොගෙවා ඇති විටක, දායකයාගෙන් එතෙක් අය වූ දායක මුදල් හා ඊට අයත් පොළිය උපදේශක කාරක සභාවේ එකගත්වය මත එකවර ගෙවනු ලබන ගොනු මුදලක් ලෙස ලැබීමට එවැනි දායකයකුට හිමිකම් ඇත්තේ ය.

VII. ඉහත 9.V යටතේ හිමිකම් නොපාන්නේ නම්, එවැනි දායකයකු සඳහා උපදේශක කාරක සභාවේ එකගත්වය ඇතිව ශුද්ධ දායක මුදල හා අදාළ පොලී මුදල් එකවර ගෙවනු ලබන ගොනු මුදලක් ලෙස ලබා ගැනීමට හිමිකම් ඇත.

10. දායකයකු යෝජනා ක්‍රමයට යම් අතිරේක දායක මුදලක් නොගෙවා අවස්ථාවෝචිත පරිදි මරණ පාරිතෝෂිකයකට හිමිකම් ලැබිය යුතු ය. මරණ පාරිතෝෂිකය.

11. මෙහි (ආ) උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් සේවා කාලයක් ඇති දායකයකු වූ විට, II තීරයේ සඳහන් මරණ පාරිතෝෂිකය ලැබීමට මතු නියම කර ඇති පරිදි දායකයාගේ යැපෙන්නන්ට හිමිකම් ලැබිය යුතු ය. මරණ පාරිතෝෂිකය ලැබීමට ඇති අය.

I. මිය ගිය දායකයා විවාහකයෙකු වන විට දී —

(අ) වැන්දඹු භාර්යාව / වැන්දඹු පුරුෂයා වෙත මරණ පාරිතෝෂිකයෙන් හරි අඩක් ද, රැකියා විරහිත අවිවාහක දරුවන් අතර සමසේ ඉතිරි හරි අඩ ද ගෙවිය යුතු ය.

(ආ) රැකියා විරහිත අවිවාහක දරුවන් නොමැති විටක දී, මුළු මරණ පාරිතෝෂික මුදල වැන්දඹු භාර්යාව / වැන්දඹු පුරුෂයා වෙත ලැබීමට හිමිකම් ඇත්තේ ය.

(ඇ) දායකයාගේ වැන්දඹු භාර්යාව / වැන්දඹු පුරුෂයා ජීවත්ව නොසිටින විටෙක, මුළු මරණ පාරිතෝෂික මුදල අවිවාහක දරුවන් අතර සමසේ බෙදිය යුතු ය.

II. මිය ගිය දායකයා අවිවාහකයෙකු වන විට දී —

(අ) දායකයාගේ මව සහ පියා අතර එකී මරණ පාරිතෝෂික මුළු මුදල සමව බෙදිය යුතුය. මව සහ පියා යන අයගෙන් එක් අයෙකු පමණක් ජීවත්ව සිටී නම්, එම අය වෙත මුළු පාරිතෝෂික මුදල ලබාදිය යුතු ය.

(ආ) මව හා පියා දෙදෙනාම ජීවත්ව නොසිටින විට දී, අවිවාහක රැකියා විරහිත සොයුරු සොයුරියන් අතර එකී පාරිතෝෂික මුදල සමසේ බෙදිය යුතු ය.

III. මියගිය දායකයාගේ මරණ පාරිතෝෂිකය බාල වයස්කරුවන්ට හිමිවන අවස්ථාවල දී, ඔවුන් නමින් ග්‍රාමීය බැංකුවේ හෝ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ හෝ මහජන බැංකුවේ හෝ ලංකා බැංකුවේ හෝ බාල වයස් ගිණුමක තැන්පත් කර, ඒ බැව් අදාළ භාරකරුවන් වෙත දැනුම් දියයුතු අතර, ඒවා ලේඛන ගතකර ගිණුම් පොත් / සහතික ආරක්ෂිතව තබාගත යුතුය. බාලවයස් කරුවන්ගේ වයස සම්පූර්ණ වී ඉල්ලුම් කළ විටක ඒවා නිදහස් කර දීමට කටයුතු කළ යුතු ය.

IV. යැපෙන්නන් සම්බන්ධයෙන් නිරාකරණය කරගත නොහැකි ගැටලු පැනනගින සෑම අවස්ථාවකදීම, අධ්‍යක්ෂකවරයා විසින් උපදේශක කාරක සභාවේ එකඟත්වය මත තීරණය කරනු ලබන යැපෙන්නන්ට ගෙවීම් කළ යුතු ය.

*දින 90 ක් තුළ මරණය පිළිබඳ දැනුම් දිය යුතු බව.*

12. දායකයාගේ යැපෙන්නන් අවස්ථාවෝචිත පරිදි මරණය සඳහා වූ පාරිතෝෂිකය ලැබීමට හිමිකම් ලබන විට දී, තමාට එම හිමිකම් ලැබීමට මුල් වූ සිදුවීම පිළිබඳව අවස්ථාවෝචිත පරිදි එම දායකයාගේ යැපෙන්නන් විසින් ඒ මරණය සිදුවීමෙන් දින 90 ක් තුළ දී අධ්‍යක්ෂවරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

*මිය ගිය දායකයාගේ දායක මුදල්.*

13. දායකයා මරණයට පත් වූ විටක අධ්‍යක්ෂවරයා විසින් උපදේශක කාරක සභාවේ තීරණය මත දායකයාගේ ශුද්ධ දායක මුදල හා අදාළවන පොළිය ද, ගොනු මුදලක් ලෙස 11 වැනි නියෝගයේ සඳහන් ආකාරයට දායකයාගේ යැපෙන්නන්ට ගෙවනු ලැබිය යුතු ය.

*සහතිකය නැවත වලංගු කරවා ගැනීම සඳහා දින 30 ක් ඇතුළත අභියාචනය කල යුතු බව.*

14. ප්‍රඥප්තියේ 14.II යටතේ යම් කිසි දායකයෙකුට ප්‍රතිලාභ අහිමි වන්නේ නම්, ඒ බව දායකයා වෙත අධ්‍යක්ෂවරයා දැනුවත් කල දින සිට, තම සහතිකය වලංගු කරවා ගැනීම සඳහා දින 30 ක් ඇතුළත අධ්‍යක්ෂවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කල හැකි ය.

*සේවයෙන් පහ කරනු ලැබූ හෝ සේවය අතහැර ගිය දායකයකු සම්බන්ධයෙන් වූ විට.*

15. I. යම්කිසි දායකයකු සමූපකාර සේවයෙන් පහ කරනු ලැබුවහොත් හෝ තනතුර අතහැර ගිය අයෙකු සේ සලකනු ලැබුවහොත් හෝ ඔහු, යෝජනා ක්‍රමයෙන් ඉවත් වූ ලෙස සැළකිය යුතු අතර, එවැනි අයෙකු අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව කරන ඉල්ලීමක් මත, අධ්‍යක්ෂවරයා විසින් උපදේශක කාරක සභාවේ එකගත්වය මත තීරණය කරනු ලබන දායකයාගේ ශුද්ධ දායක මුදල පමණක් ලැබීමට එකී දායකයාට හිමිකම් ලැබිය හැකි ය.

*නීත්‍යානුකුල පරීක්ෂණයකින් වරදකරුවකු වූ දායකයකු සම්බන්ධයෙන් වූ විට.*

II. එසේ වුව ද සමිතියට හෝ සංගමයට හෝ අලාභයක් සිදුකර ඇති බවට නීත්‍යානුකුල පරීක්ෂණයකින් සනාථ වී ඇති විටක, හෝ එවැනි නීත්‍යානුකුල පරීක්ෂණයක් පවත්වමින් සිටින අවස්ථාවක දී හෝ ඉහත කී ශුද්ධ දායක මුදල ඔහුට ගෙවිය යුත්තේ, සමිතියේ අලාභය සම්පූර්ණයෙන්ම ප්‍රතිපූර්ණ කර ඇත්නම් හෝ නීත්‍යානුකුල පරීක්ෂණය අවසන් වී සමිතියට අලාභයක් සිදු වී නොමැති බවට සනාථ වුවහොත් පමණී.

*නැවත සේවයේ පිහිටුවනු ලැබූ දායකයකු සම්බන්ධයෙන් වූ විට.*

16. යම්කිසි දායකයකු සමූපකාර සේවයේ වැඩ තහනමකට ලක්ව සිට නැවත සේවයේ පිහිටුවන ලැබුවහොත්, අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන කාලසීමාවක් තුළ දී හිඟ දායක මුදල් ගෙවා නිම කල යුතු ය.

එසේ ගෙවා අවසන් කල යුතු දිනය දායකයා වෙත දැන්විය යුතු අතර, එදිනට පෙර හිග දායක මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් ඔහුගේ සහතිකය අවලංගු වූවා සේ සැළකිය යුතු ය.

17. I. ප්‍රඥප්තියේ 13.I වගන්තිය යටතේ යම් දායකයකු වෙත නියමිත ප්‍රතිලාභ අහිමි වූ විටක, ඒ බවට දැන්වීමක් අධ්‍යක්ෂවරයා විසින් එම දායකයා වෙත යැවිය යුතු ය.

II. ඉහත 17.I යටතේ සහතිකය අහිමි වූ යම්කිසි දායකයකුට තව දුරටත් යෝජනා ක්‍රමයේ රැඳී සිටීමට අපේක්ෂා කරනු ලබන්නේ නම්, ඔහු විසින් සමිතියට සිදුකර ඇති අලාභය සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කොට අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව ඉල්ලීමක් කල හැකිය. එසේ කරනු ලබන ඉල්ලීම 17.I වගන්තිය අනුව දැන්වීම ලැබී මාස 03 ක් ඇතුළත අධ්‍යක්ෂවරයා වෙත එවිය යුතු ය.

III. ඉහත 17.II ඉල්ලීම පරිදි යෝජනා ක්‍රමයේ තව දුරටත් රැඳී සිටීමට ඉඩ ලබා දුන් විටෙක, අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන කාලසීමාවක් තුළ දි හිග දායක මුදල් ගෙවා නිමකල යුතුය. එසේ ගෙවා අවසන් කලයුතු දිනය දායකයා වෙත දැන්විය යුතු අතර, එදිනට පෙර හිග දායක මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් ඔහුගේ සහතිකය අවලංගු වූවා සේ සැළකිය යුතුය. කෙසේ නමුත් අධ්‍යක්ෂවරයා විසින් නියම කරන කාලය මාස 6 ක් නොඉක්මවිය යුතු ය.

18. I. වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් ඉක්බිතිව, කිසියම් දායකයකු වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට ප්‍රථමයෙන් විධිමත්ව සේවයෙන් විශ්‍රාම ගන්නා දායකයෙකුට, ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාව වනවිට ගෙවා සම්පූර්ණ කර ඇති දායක මුදල් වාරික සංඛ්‍යාව පදනම් කරගෙන, මෙම නියෝගවල (අ) උපලේඛනයේ වගු අංක 01 හි IV වැනි තීරුවේ දැක්වෙන විශ්‍රාම වැටුපක් ලැබීමට වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට හිමිකම් ලැබිය යුතු ය. වයස අවුරුදු 60 ට පෙර විශ්‍රාම ගත් දායකයකු සම්බන්ධයෙන් වූ විට.

II. නොඑසේ නම්, එවැනි දායකයකු විසින් අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව කරන ඉල්ලීමක් මත, අධ්‍යක්ෂවරයා විසින් උපදේශක කාරක සභාවේ එකඟත්වය මත තීරණය කරනු ලබන දායකයාගේ ශුද්ධ දායක මුදල සහ ඊට අදාළවන පොළිය එකවර ගෙවන ගොනු මුදලක් ලෙස ලැබීමට එකී දායකයාට හිමිකම් ලැබිය යුතු ය.

III. එකී දායකයෙකුට හිමිකම් ඇත්තේ 18.I යටතේ විශ්‍රාම වැටුපක් හෝ 18.II යටතේ ගොනු මුදලක් යන දෙකෙන් එක් ප්‍රතිලාභයක් පමණක් ලබා ගැනීමට ය.

19. මෙම නියෝග මාලාවේ 7, 9 හා 18 යන වගන්ති ප්‍රකාරව විශ්‍රාම වැටුප් හිමිකම් ලබන දායකයකු, වයස අවුරුදු 60 සම්පූර්ණවීමට මත්තෙන් මිය ගියහොත්, මෙහි (ආ) උපලේඛනය අනුව ගණනය කරන ලද මරණ පාරිතෝෂිකය හා 13 වැනි නියෝගයේ සඳහන් වන ගොනු මුදල මෙම නියෝග මාලාවේ 11 වැනි වගන්තියේ ප්‍රකාරව හිමිකම් ලබන පාර්ශ්වයන් වෙත ගෙවනු ලැබිය යුතු ය. වයස අවුරුදු 60 ට පෙර සේවයෙන් ඉවත් වී විශ්‍රාම වැටුප් ලැබීමට පෙර මියගිය දායකයකු සම්බන්ධයෙන් වූ විට.

20. මෙම නියෝග මාලාව යටතේ ගොනු මුදලක් ලැබීමට හිමිකම් ලබන දායකයකු විසින්, සමිතියට හෝ සංගමයට හෝ අලාභයක් සිදුකර ඇති බවට නීත්‍යානුකූල පරීක්ෂණයකින් සනාථ වී ඇති විටක හෝ එවැනි නීත්‍යානුකූල පරීක්ෂණයක් පවත්වමින් සිටින අවස්ථාවක දී හෝ එකී ගොනු මුදල ඔහුට ගෙවිය යුත්තේ, සමිතියේ අලාභය සම්පූර්ණයෙන්ම ප්‍රතිපූරණය කර ඇත්නම් හෝ නීත්‍යානුකූල පරීක්ෂණය අවසන් වී සමිතියට අලාභයක් සිදුවී නොමැති බවට සනාථ වුවහොත් හෝ පමණි. සමිතියට අලාභයක් සිදුකර ඇති විටකදී ගොනු මුදල නොගෙවිය යුතු බව.

21. යම් විශ්‍රාමිකයෙකු මිය ගිය විටක ඔහු මිය යන අවස්ථාව දක්වා ලබාගෙන ඇති මුළු විශ්‍රාම වැටුප් මුදල ගෙවන ලද මුළු දායක මුදලට හා ඊට අදාළ පොලී ප්‍රමාණයට වඩා අඩු වූ අවස්ථාවකදී, එම අඩු වූ මුදල විශ්‍රාමිකයාගේ යැපෙන්නන් හට එකවර ගෙවනු ලබන ගොනු මුදලක් ලෙස ගෙවිය හැකි ය.

22. මෙම නියෝග මාලාව යටතේ, ගොනු මුදලක් හෝ ශුද්ධ දායක මුදලක් හෝ එකවර ගෙවනු ලබන මුදලක් ලෙස ලැබීමට හිමිකම් ලබන යම් දායකයකු විසින්, තම සේවා යෝජක සමිතිය හෝ සංගමය හෝ සමග නීත්‍යානුකූල ගිවිසුමක් මත ගිවිසගත් යම් මුදලක් එකී සමිතියට හෝ සංගමයට ගෙවීමට ඇති අවස්ථාවකදී, සමිතිය හෝ සංගමය විසින් දායකයාගේ එකඟත්වය සමග අධ්‍යක්ෂවරයාට කරන ඉල්ලීමක් සලකා බැලීමෙන් අනතුරුව, එසේ ගිවිසගත් මුළු මුදල හෝ ඉන් කොටසක් පියවීම සඳහා දායකයාගේ ගොනු මුදල/ශුද්ධ දායක මුදල සම්පූර්ණ හෝ ඉන් කොටසක් හෝ ඉල්ලීම් කරනු ලබන සමිතියට හෝ සංගමයට හෝ උපදේශක කාරක සභාවේ එකඟත්වය මත ගෙවිය හැකි ය. ගොනු මුදලෙන් හෝ ශුද්ධ දායක මුදලෙන් ගිවිසුම්ගත මුදල් පියවීම.

23. මෙම නියෝග මාලාවේ දක්වා ඇති ආකාරයන්ට හැර, යම්කිසි දායකයකු සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප/දීමනා/පාරිතෝෂිකය ගෙවීම පිළිබඳ ගැටලුවක් මතු වූ අවස්ථාවකදී, අධ්‍යක්ෂවරයා විසින් උපදේශක කාරක සභාවේ එකගත්වය මත තීරණය කරනු ලබන ආකාරයට කටයුතු කළ යුතුය. ගැටලු පැන නගින අවස්ථාවක.

24. සුදුසු සංකේතාංක ක්‍රමයක් භාවිතා කරමින්, ප්‍රඥප්තියේ 14.1 වගන්තියේ සඳහන් අයුරු දායකයා වෙත නිකුත්කරන සහතිකයට අමතරව යෝජනා ක්‍රමයේ කටයුතු පරිපාලනය හා කලමණාකරණය විධිමත් කිරීමට, පහත කරුණු සඳහා අත්‍යාවශ්‍ය තොරතුරු ඇතුළත් කරමින් ආකෘති පත්‍ර පිළියෙල කර භාවිතා කළ යුතු ය. ආකෘති පත්‍ර.

I. මනාපය පළ කිරීමේ ප්‍රකාශ පත්‍රය,

II. යෝජනා ක්‍රමයට බැඳීමේ ඉල්ලුම් පත්‍රය,

III. දායක මුදල් වැටුපෙන් අය කිරීම සඳහා බලය පැවරීමේ ලිපිය,

IV. මාසික දායක මුදල් අවකරණ ලේඛනය,

V. දඩ මුදල් අය කිරීමේ දැන්වීම,

VI. මරණ පාරිතෝෂිකය ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය,

VII. ගොනු මුදල හෝ ශුද්ධ දායක මුදල ආපසු ගැනීමේ ඉල්ලුම් පත්‍රය,

VIII. දායකත්වය ඒකාබද්ධ කිරීමේ ඉල්ලුම් පත්‍රය,

IX. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තව දුරටත් අවශ්‍ය වේ යයි හැඟෙන ආකෘති පත්‍ර.

සාමාජිකත්වය ඒකාබද්ධ කිරීම.

25. යම් කිසි දායකයකු සිය සේවා යෝජක සමිතිය හෝ සංගමය හෝ මගින් අයඳුම් කොට, වෙනත් සමුපකාර සමිතියක හෝ සංගමයක හෝ ස්ථිර සේවයට බැඳුනහොත්, එසේ බැඳුනු දින සිට දින 30 ක් ඇතුළත, යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂවරයා වෙත ඒ බව දැනුම් දිය යුතු අතර, අධ්‍යක්ෂවරයා විසින් හඳුන්වා දී ඇති ආකෘතියට අනුව සිය දායක සහතිකය වලංගුව පවත්වාගෙන යාම සඳහා, දායකත්වය ඒකාබද්ධ කිරීමට ඉල්ලුම් කළ යුතු ය.

ගිණුම් තැබීම.

26. පිළිගත් ගිණුම් මූලධර්ම, ප්‍රතිපත්ති හා ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් තැබීමට අධ්‍යක්ෂවරයා වග බලා ගත යුතු ය.

වාර්ෂික වියදම් ඇස්තමේන්තු.

27. I. අධ්‍යක්ෂවරයා විසින් මෙම යෝජනා ක්‍රමයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කර, උපදේශක කාරක සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු ය.

II. වාර්ෂික ඇස්තමේන්තුගත සීමාවන් ප්‍රමාණවත් නොවන අවස්ථාවල දී, ඒ සඳහා පරිපූරක ඇස්තමේන්තු සකසා උපදේශක කාරක සභාවේ අනුමැතිය ලබාගත යුතු ය.

ත්‍රෛමාසික වාර්තා.

28. සෑම කාර්තුවක් අවසානයේ දී ත්‍රෛමාසික ලැබීම් හා ගෙවීම් පිළිබඳ වාර්තාව පිළියෙල කළ යුතු අතර, එම වාර්තාව කාර්තුව අවසාන වී දින 30 ක් ඇතුළත උපදේශක කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

පහසුකම් හා සේවා.

29. යෝජනා ක්‍රමය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍යවන පහසුකම් හා සේවා ලබා ගැනීමේදී, පළාත් මූල්‍ය රෙගුලාසි හා ප්‍රසම්පාදන කමිටු සීමා අනුව කටයුතු කිරීමටත්, දෙපාර්තමේන්තු ප්‍රධානියා සතු සීමාව ඉක්මවා යන අවස්ථාවලදී, උපදේශක කාරක සභාවේ අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කළ යුතු ය.

කාර්යය මණ්ඩලය.

30. ප්‍රඥප්තියේ 3.V. වගන්තියේ දැක්වෙන ආකාරයට, යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්යය මණ්ඩලය වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ තත්කාලයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගෙන් යොදවා ගත යුතු අතර, එසේ යොදවා ගන්නා අවශ්‍ය ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සඳහා සමුපකාර කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්ගේ එකඟත්වය සහ උපදේශක කාරක සභාවේ නිර්දේශය සහිත ව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට අධ්‍යක්ෂවරයා කටයුතු කළ යුතු ය.

රාජකාරි පැවරීම.

31. අධ්‍යක්ෂවරයා විසින් යෝජනා ක්‍රමයේ කාර්යය මණ්ඩලය සඳහා රාජකාරි කොටස් පැවරීම මෙන් ම සුදුසු පරිදි බලය පැවරීම ද කළ යුතු ය.

අනනුකූලතාවය බල පැවැත්වීම.

32. මෙම නියෝගවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## (අ) උපලේඛනය

### වයඹ පළාත් සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

*වගුව අංක 01 :*

වයස අවුරුදු 18 - 55 ත් අතර වයසක දී යෝජනා ක්‍රමයට බැදෙන සේවකයින් ගෙවිය යුතු වාරික මුදල හා හිමිවන විශ්‍රාම වැටුප්

| *I වැනි තීරය* | *II වැනි තීරය* | *III වැනි තීරය* | *IV වැනි තීරය* |
|---|---|---|---|
| *යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේ දී ඊළග උපන් දිනයට වයස අවුරුදු* | *ගෙවිය යුතු මාසික දායක මුදල් වාරිකය සඳහා මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය* | *ගෙවිය යුතු අවම වාරික සංඛ්‍යාව* | *වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේ ජීවිතාන්තය දක්වා හිමිවන විශ්‍රාම වැටුප, විශ්‍රාම යන මාසයේ ලැබූ ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය* |
| 19 | 5 | 504 | 80 |
| 20 | 5 | 492 | 79 |
| 21 | 5 | 480 | 78 |
| 22 | 5 | 468 | 77 |
| 23 | 5 | 456 | 76 |
| 24 | 5 | 444 | 75 |
| 25 | 5 | 432 | 74 |
| 26 | 5 | 420 | 73 |
| 27 | 5 | 408 | 72 |
| 28 | 5 | 396 | 71 |
| 29 | 5 | 384 | 70 |
| 30 | 5 | 372 | 69 |
| 31 | 5 | 360 | 68 |
| 32 | 5 | 348 | 67 |
| 33 | 5 | 336 | 66 |
| 34 | 5 | 324 | 65 |
| 35 | 5 | 312 | 64 |
| 36 | 5 | 300 | 63 |
| 37 | 5 | 288 | 62 |
| 38 | 5 | 276 | 61 |
| 39 | 5 | 264 | 60 |
| 40 | 5 | 252 | 59 |
| 41 | 5 | 240 | 58 |
| 42 | 5 | 228 | 57 |
| 43 | 5 | 216 | 56 |
| 44 | 5 | 204 | 55 |
| 45 | 5 | 192 | 54 |
| 46 | 5 | 180 | 53 |
| 47 | 5 | 168 | 52 |
| 48 | 5 | 156 | 51 |
| 49 | 5 | 144 | 50 |
| 50 | 5 | 132 | 49 |
| 51 | 5 | 120 | 48 |
| 52 | 5 | 108 | 47 |
| 53 | 5 | 96 | 46 |
| 54 | 5 | 84 | 45 |
| 55 | 5 | 72 | 44 |

*වගුව අංක 02 :*

**අවුරුදු 55 - 60 ත් අතර වයසක දී යෝජනා ක්‍රමයට බැදෙන සේවකයින් ගෙවිය යුතු මුදල් සහ හිමිවන විශ්‍රාම වැටුප්**

| *I වැනි තීරය* | *II වැනි තීරය* | *III වැනි තීරය* | *IV වැනි තීරය* | *V වැනි තීරය* |
|---|---|---|---|---|
| *යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී ඊළග උපන් දිනයට වයස අවුරුදු* | *ගෙවිය යුතු මාසික දායක මුදල් වාරිකය සඳහා මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය* | *ගෙවිය යුතු අවම වාරික සංඛ්‍යාව* | *වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේ ජීවිතාන්තය දක්වා හිමිවන විශ්‍රාම වැටුප, විශ්‍රාම යන මාසයේ ලැබූ ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය* | *විශ්‍රාම වැටුප හිමිවන අවස්ථාව* |
| 56 සිට 59 | 5 | 60 | 40 | වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනය හෝ අවම දායක මුදල් වාරික 60 ගෙවා නිමකළ දිනය යන දෙකෙන් පසුව එළඹෙන දින සිට |
| 60 | 5 | 60 | 40 | අවම දායක මුදල් වාරික 60 ගෙවා නිමකළ දින සිට එක් අවුරුදු කාලයක් සම්පූර්ණ වූ දින සිට |

**(ආ) උපලේඛනය**

**මරණයක දී ගෙවන මරණ පාරිතෝෂිකය**

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *යෝජනා ක්‍රමයට බැඳුනු දින සිට සේවා කාලය* | *හිමිවන මරණ පාරිතෝෂිකය රුපියල්* |
| අවු 0 ට වැඩි - 5 නොවැඩි | 10,000 |
| අවු 5 ට වැඩි - 10 නොවැඩි | 15,000 |
| අවු 10 ට වැඩි - 15 නොවැඩි | 20,000 |
| අවු 15 ට වැඩි - 20 නොවැඩි | 25,000 |
| අවු 20 ට වැඩි - 25 නොවැඩි | 30,000 |
| අවු 25 ට වැඩි - 30 නොවැඩි | 35,000 |
| අවු 30 ට වැඩි | 40,000 |

05-558

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.